# Path to Success – Study Pack

## දෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## පුරවැසි අධ්‍යාපනය - 10 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී.ඉරෝෂිනී කේ. පරණගම මිය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ. පී. සිල්වා මයා

නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( අධ්‍යාපන සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

කේ.එල් නිල්මිණි පෙරේරා මෙය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යා )

**සම්පත් දායකත්වය**

- සෝමා දීගල්ල මිය - ගුරු උපදේශක (සමාජ විද්‍යා - කැලණිය කොට්ඨාසය)
- ගයනි සංදීපා විජේසිංහ මිය - බප/කැල සුභාෂී රාජකීය ම.වි.

සියලු හිමිකම් ඇවිරිණි

බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම

10-ශ්‍රේණිය දෙවන - පාඩම-කෙටිසටහන්

බලය යන සංකල්පය ලොව පුරා දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය ,ආර්ථික බලය ලෙස විවිධ ස්වරූප ගන්නා සංකල්පයකි.



01.ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක බලය යන්නෙන් අදහස් කරන්නේ එම රාජ්‍ය යට පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා පවතින හැකියාවයි.

- ❖ බලයෙහි අවසාන හිමිකරුවා. _ජනතාවය
- ❖ ජනතාව සතු බලය -පරමාධිපත්‍ය බලය වේ
- ❖ පරමාධිපත්‍ය බලය -පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය ඇතුළත් ය.

02. බලය විමධ්‍යගත කිරීම-එනම් මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීමයි. ( පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා)

03.ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කර ඇති ආකාරය.

- ❖ ජාතික මට්ටම - අමාත්‍යාංශ ලේකම්
- ❖ දිස්ත්‍රික් මට්ටම-දිස්ත්‍රික් ලේකම්
- ❖ ප්‍රාදේශීය මට්ටම-ප්‍රාදේශීය ලේකම්
- ❖ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම- ග්‍රාම නිලධාරි

04. ඒකීය රාජ්‍ය-ඒකීය රාජ්‍යයක් යනු ආණ්ඩුවේ පරිපාලන බලතල පමණක් එනම් රාජ්‍ය සතු ව්‍යවස්ථාදායකය, විධායකය ,අධිකරණය යන බල තල එක් මධ්‍යම ආණ්ඩුවක් සතුවන හා ක්‍රියාත්මක කරන රාජ්‍ය ඒකීය රාජ්‍යය නම් වේ.

❖ ඒකීය රාජ්‍යයක ලක්ෂණ

| |
|---|
| 1.ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක ,අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවක් කින් පමණක් ක්‍රියාවට නැංවීම. |
| 2. මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනතක් මගින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම. |
| 3. මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක විමධ්‍යගත කර පවතින පරිපාලන බලතල නැවත පවරා ගත හැකි විම. |

05. ඒකිය ආණ්ඩු-බලය විමධ්‍යගත කර ඇති රාජ්‍ය ඒකීය රාජ්‍යය වන අතර ඒකීය රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු ඒකීය ආණ්ඩුක්‍රම නම් වේ.

❖ ඒකීය ආණ්ඩු පවතින රාජ්‍ය-ශ්‍රී ලංකාව/මහා බ්‍රිතාන්‍යය/ප්‍රංශය
❖ නිර්වචන

සෑම ආකාරයකම අධිකාරී බලය ඒක් මධ්‍යම බල ආයතනය තුළ ඒකරාශී වී තිබේ නම් එය ඒකිය ආණ්ඩු ක්‍රමයක් වේ.

මහාචාර්ය හර්මන්.ජේ.ෆයිනර්

❖ ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ.

| |
|---|
| 1. නීති පනවනු ලබන්නේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය හෙවත් පාර්ලිමේන්තුවයි. |
| 2. රාජ්‍ය ස්වාධිපති බලය එක්බල මධ්‍යස්ථානයක් වෙත ඒකරාශී වී තිබීම. |
| 3. ව්‍යස්ථාදායකය, විධායකය, අධිකරණය යන ත්‍රිවිධ බලතල මධ්‍යම ආණ්ඩුව වෙත කේන්ද්‍රගත ව පැවති ම. |

❖ ඒකීය ආණ්ඩු ක්‍රමයක පවතින වාසි

| |
|---|
| 1. ඉක්මනින් හා පහසුවෙන් ආණ්ඩුවට තිරණ ගත හැකි වීම |
| 2. බලය ක්‍රියාවට නැංවීමේදී ආයතන දෙකක් නොමැති නිසා ගැටුම් අවම වේ. |
| 3. පරිපාලන හා අධිකරණ ක්‍රමය සමස්ත රාජ්‍ය යට ම පොදු එකක්විම. |

නිර්වචන

එක් මධ්‍යම බලආයතනයක් පමණක් නීති පැනවීම පිළිබඳ උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩු ක්‍රමයක මූලිකම ලක්ෂණ යයි .මහාචාර්ය ඒ .වී .ඩයිසි

මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතර භාවය හා අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩු ක්‍රමය තුළ නොමැතිවීම ඒකීය ආණ්ඩු ක්‍රමයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වේ.

මහාචාර්ය සි.එෆ්.ස්ට්‍රොන්ග්

0000000000000000000000000000000000000000000000000000000000000000000000

01.බලය බෙදාහැරීම- මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායකය, විධායක සහ අධිකරණ බලතල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මඟින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරාදීම බලය බෙදාහැරීම ලෙස හඳුන්වනු ලැබේ.

02. නූතන රාජ්‍යය වල බලය බෙදා හැරීමට හේතු.

| |
|---|
| 1. ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීමට. |
| 2. විවිධත්වය තුළ එක්සත් කමක් ගොඩනඟා ගැනීමේ අවශ්‍යතාවය. (විවිධ ජනවර්ග වලට අයත් ජන කොටස් ප්‍රාදේශීය වශයෙන් විසිරී සිටිය හැක. ඔවුන් පොදු ජාතිකත්වයක් යටතට ගොනු කර පාලන කටයුතුවලට සහභාගිවීම මින් අදහස් කෙරේ.) |

03. සන්ධීය රාජ්‍ය -බලය බෙදාහැරීම සිදු කරනු ලබන්නේ සන්ධීය රාජ්‍ය වලය.

❖ සන්ධීය රාජ්‍යයක ලක්ෂණ

| |
|---|
| 1. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවැතීම |
| 2. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුව සතු බලතල පැහැදිලි ව්‍යවස්ථා වක අන්තර්ගත කර තිබීම. |
| 3. ඉහළ මන්ත්‍රණ සභාවක් (උත්තර මන්ත්‍රී මණ්ඩලය ක්) ඇති කිරීම. |
| 4. රාජ්‍යයෙහි බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී තිබීම. |
| 5. සන්ධීය රාජ්‍ය තුළ මධ්‍යම හා ප්‍රාන්ත වශයෙන් බල මධ්‍යස්ථාන දෙකක් පැවතීම. |
| 6. සන්ධීය රාජ්‍ය වල ප්‍රාදේශීය ආණ්ඩු ප්‍රාන්ත යන නමින් හඳුන්වන අතර සමහර අවස්ථාවල දී සුවිශේෂ යෙදුම් භාවිතා කරයි .නිද. ස්විට්සර්ලන්තය-ප්‍රාදේශීය ආණ්ඩු කැන්ටන් ලෙස හැඳින්වේ. |

04. සන්ධීය රාජ්‍යක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග

❖ රාජ්‍ය පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම.
❖ සියලු ජන කොටස් පොදු හැඟීමෙන් යුතුව කටයුතු කිරීම.

05. සනයීය ආණ්ඩු-සන්ධීය රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු ක්‍රම සන්ධිය ආණ්ඩු හෙවත් ෆෙඩරල් ආණ්ඩුව ලෙස හඳුන්වනු ලැබේ.

- ❖ සන්ධි ආණ්ඩු ක්‍රම පවතින රටවලට නිදසුන්-ඇමරිකා එක්සත් ජනපදය/ස්විට්සර්ලන්තය/ඕස්ට්‍රේලියාව

- ❖ සන්ධීය ආණ්ඩු ක්‍රමයක යහපත් හා අයහපත් ලක්ෂණ

| යහපත් ලක්ෂණ | අයහපත් ලක්ෂණ |
|---|---|
| 1. භූමි ප්‍රමාණය විශාල රාජ්‍ය වල පරිපාලන තීන්දු ගැනීමට පහසුවීම | 1. ප්‍රාන්ත ආණ්ඩුවලට බලය බෙදා තිබීම පිළිබඳ ඔවුන් සමහර විට තෘප්තිමත් නොවීම. |
| 2. ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත්වීම. /පොදු ජාතිකත්වයක් ගොඩනගා ගැනීමට හැකිවීම | 2. ප්‍රාන්ත පරිපාලනය සඳහා අත්දැකීම් සහිත පළපුරුදු නිලධාරීන් අවම වීම තුළ පරිපාලන ක්‍රමය බිඳ වැටී ම. |

000000000000000000000000000000000000000000000000000000000000000000000

ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම හා විමධ්‍යගත කිරීම

- ❖ අතීත ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කර ඇති අයුරු


| | |
|---|---|
| අනුරාධපුර යුගය | මෙම යුගය තුළ පණ්ඩුකාභය රජු විසින් ගම් පාලනයට “ගම්භාර”“ගාමණී “නිලධාරීන් පත් කිරීම |
| පොළොන්නරු යුගය | පරාක්‍රමබාහු රජු විසින් ප්‍රාදේශීය පාලකයන් පත් කිරීම |
| බටහිර ජාතීන් | 1815 බ්‍රිතාන්‍යයන් විසින් පළාත් මට්ටමින් රෙසිඩන්ට්වරයකු පත්කිරීම. |

❖ ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ශ්‍රී ලංකාවේ පළාත් නමය පදනම් කරගෙන පළාත් සභා ක්‍රමය ඇති කළේය.

| | | |
|---|---|---|
| බස්නාහිර පළාත | සබරගමුව පළාත | දකුණු පළාත |
| වයඹ පළාත | මධ්‍යම පළාත | උතුරු මැද පළාත |
| ඌව පළාත | නැගෙනහිර පළාත | උතුරු පළාත |

❖ පළාත් සභාවක ආයතනික ව්‍යුහය




❖ පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයාය. ඔහුගේ නිල කාලය වසර 5 කි.මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන්නේ පළාත් ආණ්ඩුකාරවරයා ය

❖ මහ ඇමති පත් කරනු ලබන්නේ ආණ්ඩුකාරවරයාය. නිල කාලය වසර 5 කි .පළාතේ ආර්ථික කටයුතු සංවර්ධන ,සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රධාන කාර්යයන් වේ.

❖ පළාත් සභාව සතු බලතල හා කාර්යයන් ඇතුළත් ලැයිස්තු

1වන ලැයිස්තුව-පළාත් සභා ලැයිස්තුව-මෙහි පළාත් සභාව සතු බලතල හා කාර්යයන් දැක්වේ. ඒ යටතේ පලාතට අදාල ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම/නිවාස සංවර්ධන කටයුතු/පුනරුත්ථාපන හා නඩත්තු කටයුතු ප්‍රධාන වේ.

2 ලැයිස්තුව-සංවෘත ලැයිස්තුව-මෙමගින් මධ්‍යම ආණ්ඩුව විසින් ක්‍රියාවට නැංවිය යුත්තේ විෂය කරුණු17 සම්බන්ධ බලතල දක්වා ඇත. විදේශ කටයුතු/ජාතික

3 ලැයිස්තුව-සමගාමී ලැයිස්තුව -මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා යන ආයතන දෙවර්ගයටම සමසේ භුක්ති විඳිය හැකි බලතල ඇතුළත් ලැයිස්තුව මෙය වේ. සැලසුම් සකස් කිරීම/ජාතික නිවාස ඉදිකිරීම්/කෘෂිකාර්මික හා ගොවිජන කටයුතු/පුනරුත්ථාපන කටයුතු ප්‍රධාන වේ.

- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන-මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන කටයුතු පහසු කර ගැනීමේ අරමුණින් හා කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ වත්මන් පළාත් පාලන ආයතන පද්ධතිය ස්ථාපිත කර ඇත.
- මහා සභාව -පලාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය මහා සභාව ලෙස හැඳින්වේ.

| ආයතනය | ප්‍රධානියා |
|---|---|
| මහ නගර සභාව | නගරාධිපතිතුමා/උප නගරාධිපති |
| නගර සභාව | සභාපති/උප සභාපති |
| ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති |

0000000000000000000000000000000000000000000000000000000

තෝරාගත් රට වල ව්‍යුහාත්මක ලක්ෂණ

- ❖ ඇමරිකා එක්සත් ජනපදය.ජනපද 13 න් ආරම්භ වූ ඇ.එ.ජ. වර්තමානයේ ප්‍රාන්ත 50 සමන්විත සන්ධීය රාජ්‍යකි.




(ප්‍රාන්ත 50 යුත් වර්තමාන ඇ.එ.ජ.)

- ❖ ඇ.එ.ජ. සන්ධීය රාජ්‍යයක් ලෙස බිහි වීමට හේතු.
  1. ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීමට
  2. ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමට
  3. බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවතීම හේතුවෙන් මුහුණ දුන් කටුක අත්දැකීම් නැවත ඇති නොවීම සඳහා

- ❖ ඇ.එ.ජ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍යන්ට හිමි බලතල

| මධ්‍යම ආණ්ඩුව සතු බලතල | ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල |
|---|---|
| බදු පැනවීම හා එක්රැස් කිරීම | අධ්‍යාපනය |
| මූල්‍ය කටයුතු | සෞඛ්‍ය |
| ජාතික ආරක්ෂාව සැලසීම හා ආර්ථික සංවර්ධනය | පළාත් පාලනය හා මහා මාර්ග |
| විදේශ කටයුතු හා විදේශ වෙළඳාම | නිවාස ඉදිකිරීම් |

❖ ස්විට්සර්ලන්තය-ස්විට්සර්ලන්තය කැන්ටන් නම් ප්‍රාන්ත ආණ්ඩු 26 සමන්විත සන්ධීය රාජ්‍යයකි.

(ස්විට්සර්ලන්තය භූගෝලීය සිතියම)




❖ ස්විට්සර්ලන්ත සන්ධිය රාජ්‍යක් ලෙස බිහි වීමට හේතු

1. ප්‍රංශය, ඉතාලිය ,ජර්මනිය, ඔස්ට්‍රියාව යන රටවල් හතරට මැදිව පිහිටීම නිසා ජාතික ආරක්ෂාවට තර්ජන එල්ලවීම.
2. දැඩි භූගෝලීය විෂමතා හේතුවෙන් ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමට අපහසු වීම
3. වාර්ගික , භාශා, ආගමික, විවිධත්වයට සාර්ථක විසඳුම් සෙවීමට.

| මධ්‍යම ආණ්ඩුව සතු බලතල | කැන්ටන් සතු බලතල |
|---|---|
| ආරක්ෂක හමුදා කටයුතු | අධ්‍යාපනය |
| විදේශ කටයුතු | පුවත්පත් පාලනය |
| යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම | මහාමාර්ග, කර්මාන්ත ,ආගමන කටයුතු |
| විදේශ රටවල් හා ගිවිසුම් වලට එළඹීම | බැංකු කටයුතු |

ප්‍රශ්න

01. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක බලය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
02. ජනතාව සතු පරමාධිපත්‍ය බලයට අයත්වන කොටස් තුන නම් කරන්න.
03. බලය විමධ්‍යගත කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
04. ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කර ඇති අයුරු ඊතල සටහනකින් දක්වන්න.
05. බලය විමධ්‍යගත කිරීම සිදු වන රාජ්‍යයන් හඳුන්වන නම කුමක්ද?
06. ඒකීය රාජ්‍යයක ලක්ෂණ දෙකක් නම් කරන්න.
07. ඒකීය රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු කුමන නමකින් හඳුන්වයිද?

08. ඒකීය ආණ්ඩුක්‍රම පවතින රටවල් තුනක් නම් කරන්න.
09. ඒකීය ආණ්ඩු ක්‍රමයක් පැවතීමෙ වාසි තුනක් නම් කරන්න.
10. මහාචාර්ය ඒ.වි. ඩයිසි ඒකීය ආණ්ඩුක්‍රමයක් යන්න නිර්වචනය කර ඇත්තේ කෙසේද?
11. බලය බෙදා හැරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
12. නූතන රාජ්‍ය වල බලය බෙදා හැරීමට හේතු දෙකක් නම් කරන්න.
13. බලය බෙදාහැරීම සිදු කරන රාජ්‍ය කුමන නමකින් හඳුන්වයි ද?
14. සන්ධිය රාජ්‍යක ලක්ෂණ දෙකක් නම් කරන්න.
15. සන්ධීය රාජ්‍ය සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග මොනවාද?
16. සන්ධීය ආණ්ඩු ක්‍රම පවතින රටවල් සඳහා නිදසුන් තුනක් ලියන්න
17. මහාචාර්ය ඒ.වි.ඩයිසි විසින් සන්ධීය ආණ්ඩු ක්‍රමයක් යන්න නිර්වචනය කර ඇත්තේ කෙසේද?
18. සන්ධීය ආණ්ඩු ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න
19. සන්ධිය ආණ්ඩු ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න
20. අතීත ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කර තිබූ බවට අනුරාධපුර හා පොළොන්නරු යුගවල නිදසුන් ඇසුරෙන් ලියන්න.
21. ශ්‍රී ලංකාවේ පලාත් සභා පිහිටුවීම සිදුකරන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද?
22. ශ්‍රී ලංකාවේ පලාත් 9 ලියා දක්වන්න.
23. පළාත් සභාවක ආයතනික ව්‍යුහයන් ඇඳ දක්වන්න.
24. පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ කවුරුන් විසින්ද? ඔහුගේ නිල කාලය සඳහන් කරන්න.
25. මහ ඇමති පත් කරනු ලබන්නේ කවුරුන් විසින්ද? ඔහු සතු බලතල හා කාර්යයන් දෙකක් ලියන්න.
26. පළාත් සභාව සතු බලතල හා කාර්යයන් ඇතුළත් ලැයිස්තු තුන පිළිවෙලින් නම් කරන්න.
27. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා යන ආයතන දෙවර්ගයටම සමසේ භුක්ති විඳිය හැකි බලතල ඇතුළත් ලැයිස්තුව කුමක්ද?
28. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුන නම් කර එහි ප්‍රධානින් ලියා දක්වන්න.
29. ඇමරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට බලපෑ හේතු තුනක් නම් කරන්න.
30. ඇමරිකා එක්සත් ජනපදයෙහි මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍ය සතු බලතල වෙන් වෙන්ව ලියා දක්වන්න.
31. ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහි වීමට බලපෑ හේතු තුනක් ලියන්න.
32. ස්විට්සර්ලන්තයේ ප්‍රාන්ත ආණ්ඩු හඳුන්වනු ලබන විශේෂිත නම කුමක්ද?
33. ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව හා කැන්ටන් සතු බලතල වෙන් වෙන්ව ලියා දක්වන්න.

බහු සංස්කෘතික සමාජය

10 ශ්‍රේණිය-3 වන පාඩම -කෙටිසටහන්

❖ බහු සංස්කෘතික සමාජයක් යනු-නිර්වචන

දැනුම, ඇදහිලි ,කලාව, නීති, සිරිත් විරිත් ,ඇගයීම්, හා මිනිසා විසින් සමාජයේ ජීවත්වන පුද්ගලයකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන් ගේ සමස්ථය සංස්කෘතියයි(.ටි.බි.ටයිලර්)

සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමි කොට ගන්නා වූ ද පාරම්පරික වශයෙන් අත්පත් කොට ගන්නා වූ ද සියලුම චර්යාරටාවන් ට දිය හැකි සාමූහික නාමය සංස්කෘතියයි

(චාර්ල්ස් ඒ.එල්වුඩ්)

❖ බහු සංස්කෘතික සමාජයක පවතින අංග

| | | | |
|---|---|---|---|
| ආගම | ඇදහිලි | ආහාර පාන | දේශපාලනය |
| භාෂාව | සිරිත් විරිත් | ඇඳුම් පැළඳුම් | තාක්ෂණය |
| දැනුම | කලාව | විශ්වාස | ආචාරධර්ම |

❖ සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ

01. විවිධ ජන වර්ග, විවිධ ආගමික විශ්වාස දරන, විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත් වීම.
02. ඒ ඒ සංස්කෘතින්ට ආවේණික සිරිත් විරිත්, ආචාරධර්ම පද්ධතියක් පැවතීම.
03. ගෝලීයකරණය, සන්නිවේදන දියුණුව, සංචාරක ව්‍යාපාරය දියුණු වීම නිසා ලෝකය එකම විශ්ව ගම්මානයක් බවට පත් වී සංස්කෘතික සම්මිශ්‍රණය ඉතා වේගයෙන් සිදුවීම.

❖ ජනවර්ග අනුව ශ්‍රී ලංකාවේ ජනගහන ප්‍රතිශතය

| ජන වර්ගය | ප්‍රතිශතය |
|---|---|
| සිංහල | 74.9% |
| ශ්‍රී ලංකා දෙමළ | 11.2% |
| ඉන්දියානු දෙමළ | 4.1% |
| ශ්‍රී ලංකා යෝනක | 9.2% |

❖ ආගම් අනුව ශ්‍රී ලංකාවේ ජනගහන ප්‍රතිශතය

| ආගම් | ප්‍රතිශතය |
|---|---|
| බෞද්ධ | 70.2% |
| හින්දු | 12.6% |
| ඉස්ලාම් | 9.7% |
| ක්‍රිස්තියානි | 7.4% |



ශ්‍රී ලංකාවේ ආගමික ස්ථාන

04. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපාන ලද සාධක පිහිටීම

- භූගෝලීය පිහිටීම
- ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම හා ආසන්නව පිහිටීම.
- පෙර අපර දෙදිග වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස පිහිටීම්

සංක්‍රමණ

- විජය රජු ඇතුළු පිරිස පැමිණීම
- පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම
- භද්දකච්චානා කුමරිය ඇතුළු පිරිස පැමිණීම
- සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස පැමිණීම

ආක්‍රමණ

- සේන ගුත්තික ආක්‍රමණය
- කාලිංග මාඝ ආක්‍රමණය
- පණ්ඩු පාරින්ද ඇතුළු පිරිසගේ ආක්‍රමණය
- බටහිර යුරෝපා ජාතීන්ගේ ආක්‍රමණය

විවිධ ජාතීන් වෙළදාම සඳහා පැමිණීම

- අරාබි ජාතිකයින්/ඉන්දියානුවන්/චීන ජාතිකයින්/යුරෝපා ජාතින්

ශ්‍රමිකයින් ගෙන්වා ගැනිම

- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ ආර්ථික බෝග වගාවන් සඳහා ශ්‍රමිකයින් ලෙස දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනයා ගෙන්වා ගැනීම නිසා එම ජනතාවගේ උරුම හා අනන්‍යතාවයන් ශ්‍රී ලංකාවේ සංස්කෘතියට එක් විය.

05. බහු සංස්කෘතික ජන සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක අවශ්‍යතාව.

- සමාජයේ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතු

| |
|---|
| අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම |
| රාජ්‍ය පාලනය අකාර්යක්ෂම භාවය |
| රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම |

| |
|---|
| අල්ලස් හා දූෂණය ඉහළ යාම |
| රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොර වීම |

❖ යහපාලනය යනු-

ඉහත දක්වා ඇති සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතු වලින් මිදී ජනතා සුභ සිද්ධිය උපරිම වන අයුරින් පුරවැසි අයිතිවාසිකම් හා සමාජ සාධාරණත්වය සුරැකෙන පරිදි නීතිගරුකව, විනිශවිදහාවයෙන්,,, හා වගකීමෙන් යුක්තව කටයුතු කිරීම යහපාලනය නම් වේ.

❖ යහපාලනයක මූලික ගුණාංග

| |
|---|
| 1. දූෂණයෙන් හා වංචාවෙන් තොර රාජ්‍ය පාලනය |
| 2. නිදහස් සහ සාධාරණත්වය තහවුරු කිරීම |
| 3. මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම |
| 4. විනි වීද භාවයකින් යුතුව කටයුතු කිරීම |
| 5. අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම |
| 6. නීතියේ ආධිපත්‍යයට ගරුකිරීම හා අධිකරණ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම |

❖ බහු සංස්කෘතික සමාජයක පාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන ප්‍රයෝජන (ධනාත්මක ප්‍රතිඵල)

| |
|---|
| 1. ජනවර්ග හා කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වේ |
| 2. එකිනෙකා අතර අවබෝධය පුළුල් වෙයි |
| 3. එකිනෙකාට ගරු කිරීමට හුරු වේ |
| 4. විනිවිදභාවයෙන් කටයුතු කරයි |
| 5. ආගමික ,සංස්කෘතික විවිධතා නොසලකා සහජීවනයෙන් කටයුතු කරයි |

❖ බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග.

| |
|---|
| 1. අන්‍යාගම්වලට අවමන් නොකිරීම |
| 2 අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම |
| 3 ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම |
| 4. සමානාත්මතාවය |
| 5. සාමූහිකත්ව වර්ධනය |
| 6. අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම |
| 7. සර්ව ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |

❖ බහු සංස්කෘතික ජන සමාජයක සාමාජිකයන් ලෙස සියලු ජනයා එක්සත්ව කටයුතු කිරීමෙන් අත් වන වාසි.(ධනාත්මක ප්‍රතිඵල)

| |
|---|
| 1. ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ |
| 2. ගැටුම් අවම වේ |
| 3. අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය තහවුරු වේ |
| 4. එක් ජාතියක් එක් රටක් යන හැඟීම වර්ධනය වේ |
| 5. මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ |
| 6. රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියකුම නොපිරිහෙලා යුතුකම් ඉටු කිරීමට පෙළඹෙයි |
| 7. අන්‍ය ආගම් හා සංස්කෘතීන්ට අගෞරව නොවන ආකාරයට හැසිරීමට හුරු වේ. |

❖ බහු සංස්කෘතික සමාජය හා නූතන රාජ්‍ය

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ක්‍රියාත්මක වන නූතන රාජ්‍යයන් උත්සහ ගනු ලබන්නේ තම රටේ පවතින විවිධ සංස්කෘතික අනන්‍යතාවයට ගරු කරමින් විවිධ තා සමෝධානය කරමින් එක් ජාතියක් වශයෙන් ස්වාධීනව සංවර්ධනය කරා ගමන් කිරීමට ය.

❖ වර්තමානයේ බොහෝ සංවර්ධිත රටවල් තම රටෙහි සංස්කෘතික භාවය හොඳින් ප්‍රයෝජනයට ගෙන ඇත. ඒ සඳහා නිදර්ශනය වන්නේ සිංගප්පූරුව හා ස්විට්සර්ලන්තය තම බහුවිධ සංස්කෘතික භාවය තුළ "වෙනස්කමම තුළින් එකමුතු බව" යන්න තේමා කර ගනිමින් සංවර්ධනය කරා පිවිසි රටවල්ය.

❖ ලොව ඉන්දියාව හා ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල් ඉතා සංකීර්ණ බහු සංස්කෘතියන් පවතින රටවල ට නිදසුන් වේ.




ප්‍රශ්න

01. සංස්කෘතිය යන්න සරල නිර්වචනයක් ලියා දක්වන්න.
02. ටි.බි.ටයිලර් හා චාර්ල්ස්.ඒ.එල්වුඩ් යන්න සමාජ විද්‍යාඥයින් සංස්කෘතිය යනු නිර්වචනය කර ඇති ආකාරය ලියා දක්වන්න.
03. බහු සංස්කෘතික සමාජයක පවතින අංග 12 නම් කරන්න
04. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ තුනක් සඳහන් කරන්න
05. ජනවර්ග අනුව ශ්‍රී ලංකාවේ ජනගහන ප්‍රතිශතය ලියා දක්වන්න
06. ආගම් අනුව ශ්‍රී ලංකාවේ ජනගහන ප්‍රතිශතය ලියා දක්වන්න
07. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරී බලපා ඇති ප්‍රධාන සාධක වන පිහිටීම, සංක්‍රමණ, ආක්‍රමණ, විවිධ ජාතීන් වෙළදාම සඳහා පැමිණීම, ශ්‍රමිකයින් ගෙන්වාගැනීම යන සාධක සඳහා නිදසුන් වෙන් වෙන්ව ලියා දක්වන්න.
08. සමාජයක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතු හතක් සඳහන් කරන්න.
09. යහපාලන සංකල්පය යනු කුමක්ද?

10. යහපාලනයක තිබිය යුතු මූලික ගුණාංග අටක් නම් කරන්න.
11. බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන ධනාත්මක ප්‍රතිඵල හතක් ලියන්න..
12. බහුසංස්කෘතික ජන සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග අටක් සඳහන් කරන්න
13. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් අත්වන ධනාත්මක ප්‍රතිඵල පහක් සඳහන් කරන්න.
14. ලොව ඉතා සංකීර්ණ බහු සංස්කෘතික භාවයන් තිබෙන රටවල් දෙකක් සඳහන් කරන්න.
15. වෙනස්කම තුළින් එකමුතු බව යන්න තේමා කර ගනිමින් වර්තමානයේ සංවර්ධනය කරා ගිය රටවල් දෙකක් සඳහන් කරන්න.
16. ශ්‍රී ලංකාවේ සියලු ජනයා පොදුවේ වන්දනාමාන කරන ආගමික ස්ථාන මොනවාද?